# රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
## MINISTRY OF PUBLIC ADMINISTRATION AND HOME AFFAIRS

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திர சதுக்கம், கொழும்பு 07, லங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
**Website : www.pubad.gov.lk**

| | | |
|---|---|---|
| දුරකථන / தொலைபேசி : / Telephone (94) 011-2696211-13 | ෆැක්ස් / பெக்ஸ் : / Fax (94) 011-2695279 | ඊ මේල් / -தபால் : / E - mail secretary@pubad.gov.lk |
| මගේ අංකය / எனது இல : / My No COM 2/TRANS/03/0015 | ඔබේ අංකය / உமது இல : / Your No | දිනය / திகதி : / Date 2009.10.26 |


සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්වරුන් හා

දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## 2010 වාර්ෂික ස්ථාන මාරුවීම් - රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය
## ( ඒකාබද්ධ සේවය)

මේ සමග අමුණා ඇති උපලේඛණයේ සඳහන් මාරුවීම් 2010.01.01 දින හෝ නිලධරයන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි (සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන දීර්ඝ කරන ලද ස්ථානමාරු දිනයන් සඳහන් නිලධරයන්ට පමණක් ඔවුන්ගේ නම් ඉදිරියේ ක්‍රියාත්මක විය යුතු දිනයන් සඳහන් කොට ඇත). මේ බව අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ අදාල නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙනු මැනවි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව / අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව / මැතිවරණ දෙපාර්තමේන්තුව යන ස්ථානවලට ස්ථාන මාරු කරන ලද නිලධරයන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුත්තේ අදාල ආයතන ප්‍රධානීන්ගේ එකඟත්වයට යටත්ව බව ද දන්වමි.

02. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයන්ට මෙම වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු වේ. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

03. ඒකාබද්ධ සේවා නියෝගවලට යටත් යම් කිසි නිලධරයෙකුට ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩල මගින් ද අභ්‍යන්තර මාරු කිරීම් සඳහා නියෝග නිකුත්කර ඇත්නම් එහිදී ඒකාබද්ධ සේවා ස්ථාන මාරු නියෝගයන් ක්‍රියාත්මක විය යුතු වේ. එසේ වුවද නිලධරයන්ගේ ඉල්ලීම මත/දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් මත අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දී ඇති ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු යැයි ඔබ අදහස් කරන්නේ නම් මෙම ලිපියේ 07 වන ඡේදයේ සඳහන් වන දිනට පෙර ඔබගේ නිර්දේශ ද ඇතිව අදාල ඉල්ලීම සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීම මැනවි.

04. මෙම ස්ථාන මාරුවීම් කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පරිපාටිය, 2009.06.22 දිනැති අංක 02/2009 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සමග මේ වන විටත් ඔබ වෙත එවා ඇත. මේ සමග ඇති ස්ථාන මාරුවීම් නියෝග, මාරුවීම් ඉල්ලා තිබූ සියළුම නිලධරයන්ට දැනගැනීමට සැලැස්විය යුතු වේ.

05. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට 2009.12.31 දින දක්වා කල් දමන ලද මීට ඉහතදී නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝගයන් වේ නම් එවැනි නිලධරයකුට නැවත 2010 වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් වෙනස් ස්ථාන මාරු නියෝගයක් ලබාදී ඇත්නම් එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත වන බව සලකන්න.

06. මෙම ස්ථාන මාරු පරිපාටියෙහි හෝ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2009 හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථානමාරු කමිටුවේ අවධානයට යොමු වී නොමැත්තේ නම් පමණක් ඒ අනුව අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

07. අභියාචනා ඉල්ලුම් පත්‍රයෙහි ආදර්ශ ආකෘති පත්‍රයක් මේ සමග අමුණා ඇත. අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමට එම ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම්පත් 2009.11.10 දිනට ප්‍රථම එවන මෙන් කරුණාවෙන් දන්වමි. එදිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවද අදාල නිලධරයන්ට දැන්විය යුතු වේ.

08. ඔබ අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධාරීන්, **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර මෙම ස්ථාන මාරුවීම් ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කල යුතු බැව් ද දන්වමි. විධිමත් අනුමැතියකින් තොරව මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හැර සිටින නිලධාරීන් සම්බන්ධයෙන් 02/2009 චක්‍රලේඛයේ 5:11 අනුව කටයුතු කල හැකි බවද දන්වමි.

බී.පී.පී.එස්.අබේගුණරත්න,

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

<u>2010 වාර්ෂික ස්ථාන මාරුවීම් - අභියාචනා පිළිබඳ ඉල්ලුම් පත්‍රය</u>

| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ මාරුවීම් ලේඛණයේ අනන්‍යතා අංකය:- ...................................... |
|---|

අමාත්‍යාංශය :- ....................................................
දෙපාර්තමේන්තුව :- ...............................................

(අ) නිලධාරියා විසින් සම්පූර්ණ කල යුතුය.

01. I. නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්).

.................................................................................................මහතා/මිය/මෙනවිය
II. ස්ථිර ලිපිනය:-
....................................................................................................
III. පදිංචි ස්ථානයේ ලිපිනය :-
.....................................................................................................
IV. 2009 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය:-
.....................................................................................................

02. තනතුර :- රා.ක.ස.සේ. I/ II/ III
සේවයට ඇතුලත්වූ දිනය :- ........................................
ශ්‍රේණියට ඇතුලත්වූ දිනය :-.......................................
උපන් දිනය :-...........................................
2009.12.31 දිනට වයස අවු. :-....................

| සේවා විස්තර | පත්වූ දිනය | සේවා ස්ථානය සිට/දක්වා |
|---|---|---|
| .......................... | ........................ | ..................................... |
| .......................... | ........................ | ...................................... |

03. මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය./සංශෝධනය කිරීමටය./ ස්ථාන මාරුවක් ලබා දෙන ලෙසය.

04. ස්ථාන මාරුව සංශෝධනය කලයුතු / ලබාදිය යුතු සේවා ස්ථානය:-

අමාත්‍යාංශය :-...........................
දෙපාර්තමේන්තුව :-.........................

දිනය :-------------------- ......................................
නිලධාරියාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :-

I. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ.
සඳහන් කළයුතු විශේෂ කරුණු ඇත/නැත (ඇත්නම් පහත දක්වන්න)
.......................................................................................................................
II. ඉහත අභියාචනා පත්‍රය නිර්දේශ කරනු ලැබේ/නොලැබේ.

දිනය :-......................... ..................................................
අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

( අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකල අයදුම්පත් අභියාචනා මණ්ඩලය විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිට සඳහන් කරන්න)